# 2023/09/27 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

2023/09/27 වන දින පෙ.ව.10.00ට සභා ලේකම්තුමිය විසින් පැමිණ සිටි කලාප භාර විමර්ශන නිලධාරී ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා, කාර්මික නිලධාරී ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා, ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) ජී.කේ.ද සොයිසා මහත්මිය, සංවර්ධන නිලධාරී ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය, කළමනාකරණ සේවා නිලධාරී කේ.තරිඳු දර්ශන ප්‍රියකෑලුම් මහතා හා විෂය නිලධාරී පිළිගනිමින් කළමනාකරණ කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව සභා ලේකම්තුමිය විසින් 2023/09/14 දිනැති පසුගිය කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව කමිටු සාමාජිකයින් ඒකමතිකව අනුමත කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

I. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛණය සඳහා අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල වවුචර්පත්

a. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛන

| අනු අංකය | නම හා විස්තරය | ගෙවූ මුදල | කමිටු තීරණය |
|---|---|---|---|
| 01. | කළමනාකරු, ඔෆිස් වන්, අංක 18/1, බැංකු පාර, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලයේ Laptop පරිගණක යන්ත්‍ර 03 සඳහා අවශ්‍ය Mouse 03ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම.(රු:5,000.00 සීමාව යටතේ මිල ගණන් කැඳවීමකින් තොරව මිලදී ගැනීමට තීරණය කරන ලදී.) (බිල්පත් අංක - ON-00009736) | 4,050.00 | නිර්දේශ කරන ලදී. |
| 02. | ඉන්දික රුවන් කුමාර මයා, කැටවත්ත පාර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ කාර්යාලය සඳහා අවශ්‍ය ප්‍රථමාධාර පෙට්ටිය මිළදී ගැනීම වෙනුවෙන් මිල ගණන් පියවීම. (බිල්පත් අංක - 466) | 4,250.00 | නිර්දේශ කරන ලදී. |
| 03. | කළමනාකරු, රත්න සුපර් සිටි, නුවර පාර, මීගහකිවුල - කාර්යාල අවශ්‍යතාවය සඳහා හා පොදු පහසුකා මධ්‍යස්ථානයට ලබා දීම සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. (සබන්, කපුරු පැකට්, වැසිකිලි සේදුම්කාර දියර, බිම් සේදුම්කාර දියර, ක්ලොරීන්, භාජන පිරිසිදු සේදුම්කාර සබන්, කොසු, ඉදල්, බිල්පත් අංක - 1748) | 47,625.00 | නිර්දේශ කරන ලදී. |
| 04. | එම්.එස්.එන්.ඉට් සොලූෂන්, නො. 287/4, පහළ වීදිය, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ පරිගණක පත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් මිළ ගණන් පියවීම. (බිල්පත් අංක -Inv0000092) | 23,000.00 | නිර්දේශ කරන ලදී. |
| 05. | ඩී.එම්.අයි.එස්.දිසානායක මයා, අයි.එස්.මාර්කටින්, නුවර පාර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු විදි ලාම්පු අලුත්වැඩියා කටයුතු සඳහා මිළදී ගැනීම් වෙනුවෙන් මිළ ගණන් පියවීම. (ලැම්ප් හොල්ඩර්, බිල්පත් අංක - 3093) | 2,650.00 | නිර්දේශ කරන ලදී. |
| 06. | කළමනාකරු, දිනුෂා ට්‍රේඩ් එජන්සි, අංක 09, බසාර් වීදිය, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු විදි ලාම්පු අළුත්වැඩියා කටයුතු සඳහා මිළදී ගැනීම් වෙනුවෙන් මිළ ගණන් පියවීම. (1/1.13mm වයර් රෝල්, L.E.D. බල්බ 15W ලක්ෂපාන, ඉන්සියුලේටර් ටේප් රෝල් වයිනා, බිල්පත් අංක - 020) | 19,150.00 | නිර්දේශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 07. | ජේ.ඩබ්.එස්.එම්.වසන්ත කුමාර මහත්තේමයා, ශ්‍රී ලංකා ගුරු සේවය 2 I - චිත්‍ර තරඟ විනිශ්චය කටයුතු වෙනුවෙන් සහභාගී වීම වෙනුවෙන් 2023/09/14 දින ගමන් වියදම් ගෙවීම. | 1,520.00 | නිර්දේශ කරන ලදී. |
| 08. | ඩී.එම්.ආර්.යු.කේ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර සඳහා 2023 සැප්තැම්බර් මස 01 සිට 15 දක්වා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම. | 71,610.00 | නිර්දේශ කරන ලදී. |
| 09. | චන්ද්‍රසිරි මෝටර්ස්, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 252-6368 කැබ් රථයේ ක්ලච් පොම්පයයේ තෙල් කාන්දු වීම අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. (බිල්පත් අංක -34) | 4,940.00 | නිර්දේශ කරන ලදී. |
| 10. | එස්.එම්.ඒකනායක බණ්ඩා මයා, ආදායම් පරීක්ෂක(වැ.බ.) – 2023 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 2,500.00 | නිර්දේශ කරන ලදී. |
| 11. | එස්.එම්.ඒකනායක බණ්ඩා මයා, ආදායම් පරීක්ෂක(වැ.බ.) – 2023 ජූලි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 2,500.00 | නිර්දේශ කරන ලදී. |
| 12. | ඩී.එම්.ධනපාල මයා, පුබුදු කොන්ක්‍රීට් ඇන්ඩ් හාඩ්වෙයාර්, කෙසෙල්වත්ත, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ CCTV කැමරාව සවි කිරීමට හා ජල පවිත්‍ර ඒකකය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් පියවීම. | 8,300.00 | නිර්දේශ කරන ලදී. |

II. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු UPLL-7774 කැ෴ කැබ් රථය සඳහා අවශ්‍ය 90A බැටරියක්, ටොන් 04 ජැක් 01ක් සහ වීල් බ්‍රෂ් 01ක් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවීම සඳහා අවශ්‍ය නිරදේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

III. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 252-6368 කැබ් රථය සඳහා අවශ්‍ය ටොන් 05 ජැක් 01ක් සහ බකට් කාපට් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවීම සඳහා අවශ්‍ය නිරදේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

IV. මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලයේ අවශ්‍යතාවයන් මත පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවීම සඳහා අවශ්‍ය නිරදේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

| අනු අංකය | අවශ්‍ය ද්‍රව්‍ය | ප්‍රමාණය | ඉල්ලුම් කරන ලද හේතුව |
|---|---|---|---|
| 01 | සල්ලාඩි දැල | 1m උස, දිග 1.5m | මීගහකිවුල ජල මෝටරය ආවරනයට හා ජල ටැංකිය ඉහල ආවරණයට |
| 02 | ❖ 1/1.13mm වයර් රෝල්<br>❖ කන්ඩියුට් pvc ½ බට<br>❖ LED 15 බල්බ<br>❖ Sun box singal<br>❖ 1 gan ස්විච්<br>❖ බයින්ඩින් කම්බි<br>❖ ඉන්සියුලේටර් වයර් ටේප්<br>❖ බැටන් හෝල්ඩර්<br>❖ 6mm නට් ඇන්ඩ් බෝල්ට් ඇණ | 02<br>10<br>10<br>10<br>10<br>1 ½ kg<br>02<br>10<br>20 | වීදි ලාම්පු අලුත් වැඩියා කටයුතු සඳහා |
| 03 | ❖ 01විදුලි පන්දම | 01 | රත්නසිරි මහතා සඳහා මාර්ග කම්කරු |

| | | | |
|---|---|---|---|
| 04 | ❖ ත්‍රෙඩ් සීල් අගල් 01 පැකට්<br>❖ හැක්සෝ තල<br>❖ බොල් වැල් ½<br>❖ වැල් සොකට් අගල් 01<br>❖ එන්ඩ් කප් අගල් ½<br>❖ එන්ඩ් කප් අගල් 1<br>❖ එන්ඩ් කප් අගල් 1 ¼<br>❖ එන්ඩ් කප් අගල් 1 ½ | 10<br>05<br>20<br>50<br>50<br>50<br>05<br>05 | ගබඩාවේ නොමැති බැවින් මිළදී ගැනීමට |

V. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන කිරීමේ සංස්ථාව වෙතින් L&M/LA/2019694 අංකය හා 2023.08.24 දිනැති ලිපිය මඟින් 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4(අ)1 වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව ඉදිරිපත්කළ ලිපිය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් සහ දේපල සම්බන්ධයෙන් සංවර්ධන හා නඩත්තු කටයුතු සිදු කිරීමේදී එම කටයුතු සඳහා ඒ සම්බන්ධව පවතින නීතිරීතිවලට බලපෑමක් නොවන ආකාරයට යටත්ව එකඟතාවය ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

- මේ සම්බන්ධව එම ආයතනයෙන් පළ කරනු ලබන ගැසට් නිවේදනය සම්බන්ධයෙන් අප ආයතනය දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසීමට කටයුතු කරන ලෙස දන්වා යැවීමටද කළමනාකරණ කමිටුව නිර්දේශ කරන ලදී.

VI. මීගහකිවුල ප්‍රාදේශීය සභාවට සතු සති පොළවල් සහ මීගහකිවුල පොදු පහසුකා මධ්‍යස්ථානය 2024 වර්ෂය සඳහා බදු දීමට අදාල මිල ගණන් මිල තීරණය කිරීමේ කමිටුව විසින් තීරණය කල පහත සඳහන් වටිනාකම් සඳහා හා සති පොළවල් සහ මීගහකිවුල පොදු පහසුකා මධ්‍යස්ථානය ටෙන්ඩර් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

| සතිපොළේ නම | අවම ලංසු මුදල | | ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තු(රු) | ආපසු ගෙවන තැන්පතු(රු) | මාස 03ක ඇප තැන්පතු(රු) |
|---|---|---|---|---|---|
| | වාර්ෂිකව(රු) | මාසිකව(රු) | | | |
| මීගහකිවුල සතිපොළ | 2,817,000.00 | 234,750.00 | 8,000.00 | 60,000.00 | 704,250.00 |
| කරමැටිය සතිපොළ | 50,400.00 | 4,200.00 | 3,000.00 | 18,000.00 | 12,600.00 |
| තල්දෙන සතිපොළ | 84,000.00 | 7,000.00 | 3,000.00 | 13,000.00 | 21,000.00 |
| පිටමාරුව සතිපොළ | 84,000.00 | 7,000.00 | 3,000.00 | 13,000.00 | 21,000.00 |
| මීගහකිවුල පොදු පහසුකා මධ්‍යස්ථානය | 203,520.00 | 16,960.00 | 4,000.00 | 20,000.00 | 50,800.00 |

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, සභා ලේකම්තුමියගේ ස්තුති කතාවෙන් අනතුරුව කළමනාකරණ කමිටුව පෙ.ව.12.00ට අවසන් කරන ලදී.

**කමිටු සාමාජිකයින්:-**

1) ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙනවිය (සභාපති) -
2) ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා (කමිටු සාමාජික) -
3) ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා (කමිටු සාමාජික) -
4) ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා (කමිටු සාමාජික) -

5) ජී.කේ.ද සොයිසා මහත්මිය (කමිටු සාමාජික) - 

6) ජ්.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය (කමිටු සාමාජික) - 

7) කේ.තරිඳු දර්ශන ප්‍රියකෑළුම් මහතා (කමිටු සාමාජික) - 